# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
# කොළඹ

## පුවත්පත් නිවේදනය

**<u>ශ්‍රී ලංකා රජයේ මාධ්‍ය නිලධාරීන් සඳහා ඉන්දියාවේ පුහුණු වැඩසටහනක්</u>**

ශ්‍රී ලංකා රජයේ මාධ්‍ය නිලධාරීන් 30 දෙනෙකුගෙන් සමන්විත දූත පිරිසක් විශේෂ පුහුණු වැඩසටහනකට සහභාගී වීම සඳහා 2025 අගෝස්තු 17 – 30 වන දින දක්වා ඉන්දීය සංචාරයක නිරත විය. අග්‍රාමාත්‍ය මාධ්‍ය ඒකකය, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මෙන්ම දිස්ත්‍රික් මාධ්‍ය ඒකකවල නියෝජිතයන් මෙම දූත පිරිසට අයත් විය. ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා 2025 අප්‍රේල් මාසයේ සිදු කරන ලද ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී ශ්‍රී ලාංකික වෘත්තිකයන් සඳහා වාර්ෂිකව විශේෂයන් සැකසූ පුහුණු අවස්ථා 700ක් ලබා දෙන බවට කළ නිවේදනයෙන් අනතුරුව මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.

2. මෙම වැඩසටහන ශ්‍රී ලංකා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි ඉන්දීය රජය විසින් සංවිධානය කරන ලදී. සුෂ්මා ස්වරාජ් විදේශ සේවා ආයතනය, ජන සන්නිවේදනය පිළිබඳ ඉන්දීය ආයතනය සහ පුවත්පත් තොරතුරු කාර්යාංශය ඇතුළු පුමුඛ පෙළේ ඉන්දීය ආයතනයන් විසින් පුහුණු සැසි පවත්වන ලදී. මහජන රාජ්‍ය තාන්ත්‍රිකත්වය, පුවත්පත් සබඳතා, ඩිජිටල් මාධ්‍ය පිළිවෙත සහ මාධ්‍ය කළමනාකරණය පිළිබඳ අන්තර් ක්‍රියාකාරී සැසි වැඩසටහනට ඇතුළත් විය.

3. අත්දැකීම් ඇසුරෙන් ඉගෙන ගැනීමේ මෙම වැඩසටහනේ කොටසක් ලෙස දූත පිරිස කාර්මික තාක්ෂණය පිළිබඳ කාලිංග ආයතනය, ඔඩිෂා ප්‍රාන්ත ආපදා කළමනාකරණ අධිකාරිය සහ කාලිංග ක්‍රීඩාංගනය යනාදියේද සංචාරයන් හි නිරත වූහ. ඔවුහු ඔඩිෂා ප්‍රාන්තයේ මහ

ඇමතිතුමා ද හමු වී මාධ්‍ය සහ පොදු සන්නිවේදන ක්ෂේත්‍රයේ ද්විපාර්ශ්වික සහයෝගීතාවය ශක්තිමත් කිරීම පිළිබඳව සාකච්ඡා කළහ.

4. වෘත්තීය පුහුණුවට අමතරව වැඩසටහන තුළින් ඉන්දියාවේ වර්ධනය, ඩිජිටල් පොදු යටිතල පහසුකම්, කෘත්‍රිම බුද්ධිය ඇතුළු තාක්ෂණික දියුණුව සහ විචිත්‍රවත් සංචාරක ක්ෂේත්‍රය මෙන්ම ඉන්දියාවේ පොහොසත් සංස්කෘතික උරුමය සහ උණුසුම් ආගන්තුක සත්කාරය පිළිබඳව අවබෝධයක් ද ලබා දෙන ලදී.

5. ශ්‍රී ලංකා රජයේ මාධ්‍ය නිලධාරීන් සඳහා වූ මෙම විශේෂ පුහුණු වැඩසටහන වෘත්තීය නිපුණත්වය, දැනුම බෙදා හදා ගැනීම සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර මාධ්‍ය සහ සන්නිවේදන ක්ෂේත්‍රය තුළ ආයතනික සබඳතා තංවාලීම සඳහා ඉවහල් විය.

***

**කොළඹ**

***2025* සැප්තැම්බර් *11***